# PUBLIC ECONOMY
# (Part-VII)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of Sri Jayewardenepura***

# අයවැය හිඟය මූල්‍යයනය කිරීම


ඉදිරි වර්ෂයක් තුළ ආණ්ඩුවේ අපේක්ෂිත ආදායමට වඩා එම වර්ෂය තුළ වියදම් කිරීමට අපේක්ෂිත මුළු වියදම ඉක්මවා යන අවස්ථා පවතී.

ආණ්ඩුවේ ආදායමට වඩා ආණ්ඩුවේ වියදම ඉක්මවා යන විට ඇති වන අයවැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා ප්‍රධාන මූලාශ්‍රය වන්නේ රාජ්‍ය ණය ගැනීම වේ.

ClassWork.LK

# <u>අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර</u>

මෑත වර්ෂවල ශ්‍රී ලංකාවේ ආණ්ඩුව අය වැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා මූලාශ්‍ර පහත දැක්වෙන ගැලීම් සටහනින් ඉදිරිපත් කර ඇත.




ClassWork.LK

# <u>අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ණය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර</u>

අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ණය ලබා ගන්නා ප්‍රධාන මූලාශ්‍ර දෙකකි.

- දේශීය මූලාශ්‍රය
- විදේශීය මූලාශ්‍රය

දේශීය මූලාශ්‍ර නැවත කොටස් දෙකකි.

- වෙළෙඳපොළ මූලාශ්‍ර
- වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර

ClassWork.LK

# වෙළෙඳපොළ මූලාශ්‍ර

ආණ්ඩුව මූල්‍ය වෙළෙඳපොළ තුළින් භාණ්ඩාගාර බිල්පත්, පිළිණාපත්, රුපියල් ණය සුරැකුම්පත් ආදී මූල්‍ය උපකරණ භාවිත කරමින් ණය ලබා ගන්නේ නම්,

එය වෙළෙඳපොළ මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමක් ලෙස හඳුන්වනු ලැබේ.

දේශීය වෙළෙඳපොළ මූලාශ්‍ර නැවත කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය.

- බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය
- බැංකු නොවන මූලාශ්‍ර මගින් ලබා ගන්නා ණය

ClassWork.LK

## බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය

මහ බැංකුව ඇතුළු වෙනත් වාණිජ බැංකු මගින් ලබා ගන්නා ණය බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය ලෙස හඳුන්වයි.

බැංකු ක්‍රමයෙන් ලබා ගන්නා ණය උද්ධමනකාරී මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ලෙසද හඳුන්වයි.

මහ බැංකුව ඇතුළු වාණිජ බැංකු මගින් අයවැය හිඟය පියවීමට ණය ලබා ගන්නා විට ආර්ථිකයේ මූල්‍ය ප්‍රසාරණයක් සිදු වේ.

## බැංකු නොවන මූලාශ්‍ර මගින් ලබා ගන්නා ණය

ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සංවර්ධන බැංකු, රක්ෂණ සමාගම්, සේවක අර්ථසාධක අරමුදල වැනි වාණිජ බැංකු නොවන ණය මැවීමේ හැකියාවක් නැති ආයතනවලින් ණය ලබා ගැනීම බැංකු නොවන ණය ලබා ගැනීම් ලෙස හඳුන්වයි.

බැංකු නොවන මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා මුදල් මැවීමක් සිදු නොවන බැවින් මුදල් සැපයුමට බලපෑමක් ඇති නොවේ.

ClassWork.LK

## වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර

වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර ලෙස හඳුන්වන්නේ ආණ්ඩුවේ ආයතන තුළ ඇති තැන්පතු හා අතිරික්ත අරමුදල් තාවකාලිකව අයවැය හිඟය මූල්‍යයනය කිරීමට ලබාගැනීමයි.

එවැනි තාවකාලික ව ලබා ගන්නා අරමුදල් කිහිපයකි.

- පරිපාලන ණාය
- භාණ්ඩාගාරයේ තැන්පතු (මහ බැංකු අත්තිකාරම්)
- විවිධ තැන්පතු

ClassWork.LK

## අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විදේශීය මූලාශ්‍ර මගින් සම්පත් ලබා ගන්නා මූලාශ්‍ර

අය වැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විදේශීය මූලාශ්‍ර මගින් සම්පත් ලබා ගන්නා මූලාශ්‍ර දෙකකි.

- විදේශීය ණය
- විදේශීය දීමනා

## විදේශීය ණය මූලාශ්‍රය

අයවැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා විදේශීය දීමනාවලට වඩා විදේශීය ණය වැඩි වැදගත්කමක් පවතී.

අයවැය හිඟය පියවීම සඳහා විදේශීය රජයකින්, අන්තර්ජාතික මූල්‍ය ආයතනවලින් හෝ ජාත්‍යන්තර වෙළෙඳපොළවලින් ලබා ගන්නා ණය විදේශීය ණය මූලාශ්‍ර ලෙස හැඳින්වේ.

ClassWork.LK

මෙලෙස ලැබෙන ණය පවතින ණය කොන්දේසිවල ස්වරූපය අනුව සහනදායි ණය හා සහනදායි නොවන ණය වශයෙන් වෙන් කෙරේ.

- **සහනදායි ණය**

සහනදායි ණයවල දී කොන්දේසි රහිත ව හෝ ඉතා අඩු පොලියක් යටතේ හෝ ණය ගෙවීමේ විරාම කාලයක් ලබා දී හෝ එම ණය ලබා දෙයි.

- **සහනදායි නොවන ණය**

සහනදායි නොවන ණය වාණිජ ණය ලෙස හඳුන්වයි. ඉහළ පොලී පිරිවැයක් හා විවිධ කොන්දේසි යටතේ ලබා ගන්නා ණය සහනදායි නොවන ණය ලෙස හැඳින්විය හැකි ය.

ClassWork.LK

# රාජ්‍ය ණයවල ආර්ථික ප්‍රතිවිපාක

දේශීය හා විදේශීය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ශ්‍රී ලංකා ආර්ථිකයට බලපාන ආකාරය රාජ්‍ය ණයවල ආර්ථික ප්‍රතිවිපාක ලෙස හඳුන්වයි.

අයවැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගන්නා ණය මූලාශ්‍රවල ස්වභාවය මත එම ප්‍රතිවිපාක තීරණය වේ.

අයවැය හිඟය අඛණ්ඩව ඉදිරියට යාම හා රාජ්‍ය ණය ඉහළ යාම නිසා ආර්ථිකයේ අයහපත් ප්‍රතිවිපාක දෙකක් ඇති කරයි.

- වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ යාම
- පෞද්ගලික අංශයේ ආයෝජනය සඳහා දේශීය මූල්‍ය සම්පත්වල හිඟයක් ඇති වීම

ClassWork.LK

## වෙළෙඳපොළ පොලී අනුපාතිකය ඉහළ යාම

අය වැය හිඟය මූල්‍යයනය කිරීම සඳහා ආණ්ඩුව මූල්‍ය වෙළෙඳපොළෙන් ණය ලබා ගැනීමත් පෞද්ගලික අංශය වාණිජ බැංකුවලින් ණය ඉල්ලීමත් හේතුවෙන් ඇති වන තරගකාරී බව නිසා ණය පොලී අනුපාතිය ඉහළ යයි.

මහ බැංකුව ඇතුළු වාණිජ බැංකු මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ආර්ථිකයේ අයහපත් ප්‍රතිවිපාක ලබා දෙයි.

## පෞද්ගලික අංශයේ ආයෝජනය සඳහා දේශීය මූල්‍ය සම්පත්වල හිඟයක් ඇති වීම

සීමිත මූල්‍ය සම්පත් ප්‍රමාණයක් සඳහා රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය අතර තරගකාරී බව ඇති වීමෙන් පෞද්ගලික අංශයේ ආයෝජනය දුර්වල වේ.

එවැනි අයහපත් ප්‍රතිවිපාක ඇති වන්නේ වාණිජ බැංකු හා මහ බැංකුව උද්ධමනකාරී මූලාශ්‍ර වීම නිසා ය.

ClassWork.LK

වෙළෙඳපොළ නොවන මූලාශ්‍ර මගින් අය වැය හිඟය මූල්‍යයනය කිරීමට ණය ලබා ගැනීමෙන් එවැනි අයහපත් ප්‍රතිවිපාක ඇති නොවේ.

නිදසුන්:

රජයේ ආයතන සතුව ඇති අතිරික්ත මුදල් සංචිතයන් වර්ෂ අවසානයේ අයවැය හිඟය පියවීමට යොදා ගැනීම පරිපාලන ණය වේ.

මෙමගින් මූල්‍ය ප්‍රසාරණයක් ඇති නොවන අතර උද්ධමනකාරී බලපෑම් ඇති නොවේ.

විදේශීය ණය හා ප්‍රදාන නිසා ද ආර්ථිකයේ මූල්‍ය ප්‍රසාරණයක් ඇති විය හැකි ය.

විදේශීය මූලාශ්‍ර අයවැය හිඟය මූල්‍යයනය කිරීමට යොදා ගැනීම නිසා විදේශීය වත්කම් ප්‍රමාණය ඉහළ යාමෙන් මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑම් ඇති කරන අතර විදේශීය ණය සහ දීමනා දේශීය මුදල්වලට පරිවර්ථනය කිරිමෙන්ද ආර්ථිකයේ ප්‍රසාරණාත්මක බලපෑම් ඇති විය හැකි ය.

ClassWork.LK

# රාජ්‍ය ණය සංයුතිය

මෑත කාලීන ව රාජ්‍ය ණයෙහි සංයුතිය පහත දැක්වෙන සංඛ්‍යා සටහන විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලි කර ගත හැකි ය.

| ශීර්ෂය | වර්ෂය | |
|---|---|---|
| | 2014 | 2015 |
| ණය උපකරණ අනුව | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 2 8444 054 | 3 305 248 |
| භාණ්ඩාගාර බිල්පත් | 694 767 | 658 240 |
| රුපියල් ණය | 55 518 | 24 088 |
| මහ බැංකු අත්තිකාරම් | 143 898 | 151 132 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 391 083 | 68 458 |
| අනෙකුත් | 148 463 | 1 520 331 |
| මුළු ණය | 4 277 783 | 4 959 196 |
| ආයතන අනුව | | |
| බැංකු අංශය | 1 669 882 | 1 924 036 |
| මහබැංකුව | 267 777 | 156 050 |
| වාණිජ බැංකු | 1 402 205 | 1 667 986 |
| බැංකු නොවන අංශය | 2 607 901 | 3 035 160 |
| අර්ථ සාධක හා විශ්‍රාමික අරමුදල | 1 474 560 | 1 655 336 |
| ඉතිරි කිරීම් ආයතන | 379 877 | 428 236 |
| පරිපාලන ණය | 221 584 | 252 615 |
| පෞද්ගලික ව්‍යාපාරික අංශය | 500 773 | 656 367 |
| අනෙකුත් | 570 | 570 |
| මුළු ණය | 4 277 783 | 4 959 196 |

මූලාශ්‍රය : මහ බැංකු වාර්තාව

ClassWork.LK

ඉහත සංඛ්‍යා සටහනේ තොරතුරු අනුව රාජ්‍ය ණය සංයුතිය විශ්ලේෂණය කිරීමේදී රාජ්‍ය ණය උපකරණ පිළිබඳ සලකා බැලීමේදී භාණ්ඩාගාර බැඳුම්කර මගින් ණය ලබා ගැනීම වැඩි වශයෙන් සිදු කර ඇත.

ආයතන අනුව ණය ලබා ගැනීම සලකන විට බැංකු අංශයට වඩා බැංකු නොවන අංශයෙන් ණය ලබා ගැනීම ඉහළ දායකත්වයක් ගෙන ඇත.

බැංකු නොවන අංශය තුළ අර්ථසාධක සහ විශ්‍රාමික අරමුදලෙන් ණය ලබා ගැනීම ඉහළ ම අගයක් ගෙන ඇත.

2016 වර්ෂය වන විට දී එම අංශයෙන් ණය ලබා ගැනීම වර්ධනය වී ඇත.

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස දේශීය ණය 2015 වර්ෂයේ දී 44.3% ක් වන අතර විදේශීය ණය 31.7% ක් පමණ වී ඇත.

ClassWork.LK

2015 වර්ෂයේ දී විදේශීය ණය ප්‍රමාණය 2000 වර්ෂයට වඩා වැඩිවීමක් පෙන්නුම් කරයි.

සහනදායි විදේශීය ණය ඉහළ අගයක් පෙන්නුම් කරන අතර වාණිජ ණයද ඉහළ වර්ධනයක් පෙන්නුම් කරයි.

ශ්‍රී ලංකාව ලබා ගෙන ඇති මුළු ණය 2016 වර්ෂය වන විට ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ අතර එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2000 වර්ෂයට වඩා අඩු වී ඇත.

පහත දැක්වෙන සංඛ්‍යා වගුවෙන් එය පැහැදිලි වේ.

| වර්ෂය | මුළු රාජ්‍ය ණය (රු. මිලියන) | සමස්ත අයවැය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස) | (මුළු රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|
| 2000 | 1 218 700 | - 9.5 | 96.9 |
| 2005 | 222 241 | - 7.0 | 90.6 |
| 2008 | 3 588 962 | - 7.0 | 81.4 |
| 2009 | 461 422 | - 9.9 | 86.2 |
| 2010 | 4 590 245 | - 7.0 | 71.6 |
| 2013 | 4 590 245 | - 5.4 | 70.8 |
| 2014 | 7 390 899 | - 5.7 | 70.7 |
| 2015 | 8 503 227 | - 7.4 | 76.0 |

මූලාශ්‍රය : මහ බැංකු වාර්තාව

ClassWork.LK

## සමස්ත අයවැය හිඟය සහ මුළු රාජ්‍ය ණය අතර සම්බන්ධතාව

ශ්‍රී ලංකාවේ සමස්ත අයවැය හිඟය සහ මුළු රාජ්‍ය ණය අතර සම්බන්ධතාවක් පෙන්නුම් කරයි.

සමස්ත අය වැය හිඟය ඉහළ මට්ටමක පවතින විට මුළු රාජ්‍ය ණය ප්‍රමාණය ඉහළ යන අතර අය වැය හිඟය පහළ යන විට මුළු රාජ්‍ය ණය ප්‍රමාණය පහළ යාමක් පෙන්නුම් කරයි.

මුළු රාජ්‍ය ණය ඉහළ අගයක් පෙන්නුම් කළද එය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අඩු වීමක් පෙන්නුම් කිරීමට හේතුව ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය 2000 වර්ෂයට වඩා 2016 වර්ෂය වන විට ඉහළ වර්ධනයක් පෙන්නුම් කිරීම යි.

එය 2000 වර්ෂයේ දී 96.9ක් වන අතර 2005 වර්ෂයේ දී 90.6 දක්වා අඩු වීමක් පෙන්නුම් කරයි.

ClassWork.LK

## දේශීය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා ඇති වන ගැටලු

දේශීය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම ඉහළ මට්ටමක පැවතීමත් දේශීය ණය ප්‍රමාණය ඉහළ යාමත් නිසා ගෙවීමට සිදු වන පොලිය ඉහළ අගයක් ගෙන ඇත.

දේශීය ණය පොලී ගෙවීම පුනරාවර්තන වියදමේ ප්‍රතිශතයක් ලෙස පහත දැක්වේ.

| වර්ෂය | 2010 | 2012 | 2013 | 204 | 2015 |
|---|---|---|---|---|---|
| දේශීය ණය පොලී ගෙවීම් | - | 28.1% | 29.4% | 24.8% | 23.2% |

දේශීය ණය සඳහා පොලී ගෙවීම් පුනරාවර්තන වියදම් ඉහළ යාමට හේතු වී ඇත.

එය වර්තන ගිණුමේ හිගයක් ඇති වී රාජ්‍ය ඉතුරුම් පහළ යාමට හේතු වේ.

ClassWork.LK

- දේශීය ණය මූලාශ්‍ර අතරින් බැංකු අංශයෙන් ණය ලබා ගැනීම මගින් මුදල් සැපයුම මත ප්‍රසාරණාත්මක බලපෑම් ඇති කරයි.

- ඒ නිසා භාණ්ඩවල හා සේවාවල මිල ගණන් ඉහළ යාම නිසා ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයක් ඇති වේ.

- දේශීය ණය ඉහළ යාමත් බැංකු මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීමත් නිසා පෞද්ගලික අංශය වාණිජ බැංකු වෙතින් ණය ඉල්ලුම් කිරීමෙන් ආර්ථිකයේ පොළී අනුපාතිකය ඉහළ යාම කෙරෙහි බලපෑම් ඇති කරයි.

ClassWork.LK

# රාජ්‍ය ණය ලබා ගැනීමේ ආර්ථික ප්‍රතිවිපාක

රාජ්‍ය ණය ලබා ගැනීමේ ආර්ථික ප්‍රතිවිපාක කිහිපයක් පහත දැක් වේ.

- විශාල වශයෙන් ණය ලබා ගැනීම් නිසා පොළී ගෙවීම් ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය ඉතුරුම් පහළ යාම සහ ආයෝජනය පහළ යාම

- රාජ්‍ය ණය ඉහළ යාම නිසා ණය වාරික සහ පොළිය ඉහළ යාම හේතුවෙන් රාජ්‍ය වියදම් ඉහළ යාම

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වඩාත් දුෂ්කර වීම

- පෞද්ගලික අංශය වෙතින් සම්පත් ගලා නොයාම සහ ණය පොළී අනුපාතිකය ඉහළ යාම හේතුවෙන් ආර්ථිකයේ තෙරපීමක් ඇතිවීම (තෙරපුම් ප්‍රතිපාකය)

- විදේශ ණය මගින් රාජ්‍ය ණය පියවීම හේතුවෙන් ජාත්‍යන්තර ණය අර්බුදයකට මුහුණ දීමට සිදු වීම

ClassWork.LK

- ප්‍රසාරණාත්මක ණය මූලාශ්‍ර මගින් ණය ලබා ගැනීම නිසා ආර්ථිකයේ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම

- විදේශ ණය වාරික හා පොළිය ඉහළ යාමෙන් ගෙවුම් ශේෂ දුෂ්කරතා ඇති වීම

- වර්තමාන පරම්පරාව විසින් අනාගත පරම්පරාව වෙත ණය බර පැටවීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති
## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura